සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ක්‍රිස්තියානි ධර්මය I
கிறிஸ்தவம் I
Christianity I

43 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** 'බයිබලය' යන පදය බිඳී එන ග්‍රීක වචනය කුමක්ද?
(1) වුල්ගාතා (2) තියෝ (3) නෙව්මා (4) බිබ්ලොස් (5) බිබ්ලියා

**2.** දාවිත්, සාවුල් රජතුමාගේ මාළිගයට පැමිණෙන්නේ,
(1) වීණා වාදනයට ය. (2) බටනලා වාදනයට ය.
(3) මද්දල වාදනයට ය. (4) සර්පිනා වාදනයට ය.
(5) සිතාර් වාදනයට ය.

**3.** ක්‍රිස්තු පූර්ව හත්වන සියවසේ අවසාන කාර්තුවේ දී බලවත් අධිරාජ්‍යය බවට පත්වූයේ,
(1) අසිරියාව ය. (2) බබිලෝනියාව ය. (3) ජුදයාව ය. (4) ජෙරුසලම ය. (5) ෂෙකෙම් ය.

**4.** 'භාෂා ශෛලිය කලාත්මක ය; සරල ය; ඍජු ය; උසස් හෙබ්‍රෙව් ය.' මෙම ලක්ෂණ සහිත දේවධාර්මික සම්ප්‍රදාය කුමක් ද?
(1) J (2) E (3) D (4) P (5) X

**5.** මැවීම පිළිබඳ පළමු කථාවෙහි 'පොළොව' යනු
(1) විශ්වයයි. (2) ස්වර්ගයයි. (3) භූමියයි. (4) සශ්‍රීකත්වයයි. (5) කාන්තාරයයි.

**6.** කානානිවරුන්ට අනුව සර්පයාගෙන් සංකේතවත් කළේ,
(1) විනාශයයි. (2) සාපයයි. (3) ප්‍රීතියයි. (4) වේදනාවයි. (5) සශ්‍රීකත්වයයි.

**7.** ආබ්‍රහම් සමඟ ගිවිසුමක් ඇතිකර ගැනීමට ප්‍රථම, දෙවියන් වහන්සේ ගිවිසුම් ඇතිකර ගත් පුද්ගලයින් කවුරුන් ද?
(1) ආදම්, කායින් (2) නෝවා, ආබෙල් (3) ආදම්, නෝවා
(4) කායින්, ආබෙල් (5) නෝවා, කායින්

**8.** ශුද්ධ බයිබලයේ පළමුවන ග්‍රන්ථයේ සඳහන් පරිදි ජාකොබ්තුමා දේවදූතයකු සමඟ පොරබැදූ ස්ථානය කුමක් ද?
(1) පෙනුයෙල් (2) බෙතෙල් (3) හෙබ්‍රොන් (4) බෙයර්ෂෙබා (5) මොරියා

**9.** ඉශ්‍රායෙල් ජනයාගේ මිදුම්කරු වූ මෝසෙස්තුමාගේ උපත හා හැදී වැඩීම තුළින් මනාව පිළිබිඹු වන්නේ දෙවියන් වහන්සේගේ
(1) උදාරත්වයයි. (2) මානව දයාවයි. (3) දිව්‍ය සංරක්ෂණයයි.
(4) කරුණාවයි. (5) දිව්‍ය ප්‍රේමයයි.

**10.** පාස්කු භෝජනය තුළ තිත්ත පළා අනුභවයෙන් සංකේතවත් කරන්නේ,
(1) දේව නියමය කඩිනමින් ඉටුකළ යුතු බවයි.
(2) පරාජය සැමරීමයි.
(3) දෙවියන් හා ඇතිකර ගත් ගිවිසුමයි.
(4) යුධ පරාජයයි.
(5) වහල්කමේ වූ අමිහිරි දුක්ගාවිනායි.

**11.** සීනයි ගිවිසුමෙන් ඉශ්රායෙල් ජනතාව ලද විශේෂ වරප්‍රසාද නිවැරදිව දක්වන වරණය තෝරන්න.

A - පූජක රාජ්‍යයක් වීම
B - කැප වූ (ශුද්ධ වූ) ජාතියක් වීම
C - දේශයක් හිමි වීම
D - දෙවියන් වහන්සේට ම අයිති සම්පත වීම
E - විශාල ධනයක් අයිති වීම

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා E (5) D හා E

**12.** "සියොන් පුරඟන ප්‍රීති ප්‍රමෝද වන්න." සෙකරියා දිවැසිවරයාගේ ග්‍රන්ථයේ 9 වන පරිච්ඡේදයේ මෙලෙස සඳහන් වන්නේ කවරකුගේ ආගමනය අරබයා ද?

(1) දාවිත් රජුගේ (2) දිවැසිවර යෙසායාගේ
(3) සාම කුමාරයාගේ (4) දිවැසිවර හොසෙයාගේ
(5) දිවැසිවර ජෙරමියාගේ

**13.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - සමිඳාණන් වහන්සේ උසස් කළ සේක
B - සමාව දුන් සේක
C - මුදාගත් සේක
D - ස්ථාපිත කළ සේක

මින් ජෙරමියා යන්නෙහි අර්ථය සඳහන් ප්‍රකාශ වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) A හා D ය. (4) B හා C ය. (5) C හා D ය.

**14.** ආමොස් දිවැසිවරයා හඳුන්වනු ලබන්නේ කවර දිවැසිවරයකු ලෙස ද?

(1) සමාජ සාමයේ (2) සමාජ සාධාරණත්වයේ (3) සමාජ ප්‍රේමයේ
(4) සමාජ කරුණාවේ (5) සමාජ අභිමානයේ

**15.** 'හොක්මා' (Hokmah) යන හෙබ්‍රෙව් වචනයේ අර්ථය කුමක් ද?

(1) බලාපොරොත්තුව (2) ප්‍රේමය (3) ප්‍රඥාව
(4) විශ්වාසය (5) බැහැපත්කම

**16.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - සෑම පද්‍යයක් ම තත් සහිත වාද්‍ය භාණ්ඩයක් සමඟ ගයන ලද ඒවා ය.
B - සමහර ගීතිකා දුක, විලාපය හෝ මනස්තාපය හෝ ඇතිව ගයන ලද ඒවා ය.
C - බොහෝ ගීතිකා සතුටකින් හා ප්‍රශංසාවකින් ගයන ලද ඒවා ය.
D - සමහර ගීතිකා සංගීත භාණ්ඩයක් නොමැතිව ගායනා කළ ඒවා ය.
E - ඇතැම් ගීතිකා ශුද්ධ බයිබලයේ වෙනත් ග්‍රන්ථවලින් උපුටා ගත් ඒවා ය.

ගීතාවලිය ග්‍රන්ථය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A, B හා C ය. (2) A, C හා D ය. (3) B, C හා D ය.
(4) B, C හා E ය. (5) C, D හා E ය.

**17.** නව ගිවිසුමේ සඳහන් සමාජ රටා අනුව අයකැමියන් ජාතිද්‍රෝහීන් ලෙස සලකනු ලැබීමට හේතුව වූයේ,

(1) බදු අයකිරීමේ දී කෝපයෙන් කටයුතු කිරීමයි.
(2) ජනතාවට හිංසා පීඩා කිරීමයි.
(3) රජයට විරුද්ධව කටයුතු කිරීමයි.
(4) සිරිත් විරිත් ගරු නොකිරීමයි.
(5) රෝම අධිරාජ්‍යයට බදු එකතු කිරීමයි.

**18.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - 'ශාදොක්' නැමැති පූජකයාගෙන් පැවත එති.
B - ගලීලයේ ජුදස් මොවුන්ගේ නිර්මාතෘවරයා විය.
C - විවාහ නොවීම මොවුන්ගේ ජීවිත පැවැත්මේ විශේෂිත විය.
D - මොවුහු ජුදා ආගමික බල ව්‍යුහයේ ආධිපත්‍යය හෙබවූහ.
E - දේවදූතයන් හා යක්ෂයන් පිළිබඳ විශ්වාස නොකළහ.

සද්දුසිවරු පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A, B හා E ය. (2) A, D හා E ය. (3) B, C හා D ය.
(4) B, C හා E ය. (5) C, D හා E ය.

[අනෙක් පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**19.** සමදර්ශක සුභාරංචි ලෙස සලකනු ලබන්නේ,
(1) ශුද්ධ වූ මතෙව්, ක්‍රියාපොත හා ශුද්ධ වූ ජොහාන් ය.
(2) ශුද්ධ වූ මතෙව්, ශුද්ධ වූ මාර්ක් හා ශුද්ධ වූ ලූක් ය.
(3) ශුද්ධ වූ ලූක්, ශුද්ධ වූ මතෙව් හා ශුද්ධ වූ ජොහාන් ය.
(4) ශුද්ධ වූ ජොහාන්, ශුද්ධ වූ ලූක් හා ශුද්ධ වූ මාර්ක් ය.
(5) ශුද්ධ වූ මතෙව්, ශුද්ධ වූ මාර්ක් හා ක්‍රියාපොත ය.

**20.** 'මම වෙමි' යනුවෙන් ස්වයං අනාවරණ ප්‍රකාශන රැසක් ඉදිරිපත් කර ඇති නව ගිවිසුමේ ග්‍රන්ථය වන්නේ,
(1) ශුද්ධ වූ ජොහාන්තුමාගේ සුභාරංචිය ය. (2) එළිදරව් පොත ය.
(3) ශුද්ධ වූ මාර්ක්තුමාගේ සුභාරංචිය ය. (4) ශුද්ධ වූ මතෙව්තුමාගේ සුභාරංචිය ය.
(5) ක්‍රියාපොත ය.

**21.** සභාවට එක්වන විජාතීන් ගැලවීම ලැබීම සඳහා චර්මච්ඡේදන පිළිවෙත ඉටුකළ යුතු ද යන ගැටලුවට විසඳුම් සපයන ලද මන්ත්‍රණ සභාව වන්නේ,
(1) එපීස ය. (2) නිසියානු ය. (3) ජෙරුසලම් ය. (4) කැල්සිඩොන් ය. (5) ත්‍රිදෙන්තීනු ය.

**22.** පාවුලුතුමාගේ 'අවසාන කැමැත්ත' ලෙස නම් කෙරෙන හසුන කුමක් ද?
(1) ගලාති (2) පිලිප්පි (3) එපීස (4) කොලොස්සි (5) 2 තිමෝති

**23.** ක්‍රිස්තුන් වහන්සේ විසින් යුගාන්තය පිළිබඳව ඉදිරිපත් කළ උපමා කතාවක් වන්නේ කුමක් ද?
(1) වපුරන්නා (2) අබ ඇටය
(3) අකීකරු පුත්‍රයා (4) යහපත් සමරිතානුවරයා
(5) යුවතියන් දස දෙනා

**24.** මෝසෙස්තුමාගේ දස පනතට නව අර්ථයක් දෙමින් ක්‍රිස්තුන් වහන්සේ විසින් ප්‍රතිපත්ති (භාග්‍ය) අටක් අඩංගු කර පවත්වන ලද්දේ,
(1) ධර්ම දූත සේවය පිළිබඳ දේශනය යි.
(2) යුගාන්තය පිළිබඳ දේශනය යි.
(3) උපමා පිළිබඳ දේශනය යි.
(4) කන්ද උඩ දේශනය යි.
(5) සභාවේ සාංඝිකත්වය පිළිබඳ දේශනය යි.

**25.** ශුද්ධ වූ පාවුලුතුමා 'වහලා' සඳහා භාවිත කරන ග්‍රීක් වචනය කුමක් ද?
(1) ඊසා (2) ලාමා (3) තලිතා (4) මිෂ්නා (5) ඩූලොස්

**26.** "ස්වාමීන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක් නිසා ද දිළිඳුන් හට සුභ ආරංචිය දේශනා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ සේක..." . මෙසේ පැවසුයේ,
(1) ස්නාවක ජුවාම්තුමා විසින් බෞතිස්ම සිදු කරන අවස්ථාවේ දී ය.
(2) ජේසුස් වහන්සේගේ මංගල ධර්ම දේශනාවේ දී ය.
(3) ජෙරමියා දිවැසිවරයා විසින් දේශනයක් සිදුකරන අවස්ථාවේ දී ය.
(4) පේදුරුතුමා විසින් පෙන්තකොස්ත දින දේශනාවේ දී ය.
(5) පාවුලුතුමා විසින් අන්තියෝකයේ දේශනාවේ දී ය.

**27.** ජෙරුසලම් සම්ප්‍රදාය අනුගමනය කරමින් තම සුභාරංචි රචනා කර ඇත්තේ,
(1) ශුද්ධ වූ පාවුලුතුමා හා ශුද්ධ වූ මාක්තුමා ය.
(2) ශුද්ධ වූ පාවුලුතුමා හා ශුද්ධ වූ ලූක්තුමා ය.
(3) ශුද්ධ වූ මාක්තුමා හා ශුද්ධ වූ මතෙව්තුමා ය.
(4) ශුද්ධ වූ ලූක්තුමා හා ශුද්ධ වූ මතෙව්තුමා ය.
(5) ශුද්ධ වූ මතෙව්තුමා හා ශුද්ධ වූ ජොහන්තුමා ය.

**28.** ජේසුස් වහන්සේ විසින් 'නැවත ඉපදීම' පිළිබඳව කථා කිරීමේ දී එය ශාරීරික ඉපදීමක් ලෙස තේරුම් ගත් පුද්ගලයා වන්නේ,
(1) නිකදේමුස් ය. (2) අනනියස් ය.
(3) නිකොලොස් ය. (4) කොරනේලියස් ය.
(5) ප්‍රොකොරොස් ය.

**29.** කොන්සල්වරයකු සහ කිතුනුවකු වූ ෆ්ලේවියස් ක්ලෙමන්ස් මරා දමා ෆ්ලේවියා ඩොමිටිල්ලා රටින් පිටුවහල් කිරීමට ක්‍රියා කළේ,

(1) ඩෙසියස් අධිරාජ්‍යයා ය.
(2) ට්‍රාජන් අධිරාජ්‍යයා ය.
(3) මැක්සිමිනස් අධිරාජ්‍යයා ය.
(4) ඩොමිෂියන් අධිරාජ්‍යයා ය.
(5) මාකස් අවුරේලියස් අධිරාජ්‍යයා ය.

**30.** ශුද්ධ වූ ජෙරෝම්තුමා පූජකවරය ලබා කොන්ස්තන්තිනෝපලයට පැමිණ ශුද්ධ ලියවිල්ල හැදෑරුවේ කවුරුන් යටතේ ද?

(1) නසියන්ස් හි ග්‍රෙගරිතුමා
(2) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධ වූ සිරිල්තුමා
(3) ශුද්ධ වූ ජස්ටින්තුමා
(4) ශුද්ධ වූ අගොස්තීන්තුමා
(5) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධ වූ අතනාසියස්තුමා

**31.** ඔරිජන්තුමාගේ මූලික සිද්ධාන්ත වැනි කෘති ලතින් භාෂාවට පරිවර්තනය කරන ලද්දේ,

(1) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධ වූ සිරිල්තුමා ය.
(2) ශුද්ධ වූ ජස්ටින්තුමා ය.
(3) ශුද්ධ වූ අගොස්තීනුතුමා ය.
(4) ශුද්ධ වූ ජෙරෝම්තුමා ය.
(5) ටර්ටූලියන්තුමා ය.

**32.** 21 වන මන්ත්‍රණ සභාව ලෙස සලකන්නේ,

(1) කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාවයි.
(2) නිසියානු මන්ත්‍රණ සභාවයි.
(3) එපීස මන්ත්‍රණ සභාවයි.
(4) ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවයි.
(5) දෙවන වතිකාන මන්ත්‍රණ සභාවයි.

**33.** මුල් යුගයේ දී මන්ත්‍රණ සභා කැඳවීමට ප්‍රධාන හේතුවක් වූයේ,

(1) රාජ්‍ය පාලනය පිළිබඳ තීරණ ගැනීමට ය.
(2) සභා නායකයන් ලෙස රජවරු පත් කිරීමට ය.
(3) වේද භේදික මතවල වැරදි පෙන්වා දීමට ය.
(4) ගිහි ධර්මදූත සේවාව පිළිබඳව තීරණ ගැනීමට ය.
(5) රාජ්‍යයන් සඳහා වන බදු ක්‍රම හඳුන්වා දීමට ය.

**34.** 'පියාණන් සමඟ එකම භවත්වය ඇතිව' යන සංකල්පය ශුද්ධ වූ සභාවේ වේද සත්‍යතාවක් බවට පත් කළේ,

(1) නිසියානු මන්ත්‍රණ සභාවෙන් ය.
(2) කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාවෙන් ය.
(3) ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවෙන් ය.
(4) කැල්සිඩොන් මන්ත්‍රණ සභාවෙන් ය.
(5) එපීස මන්ත්‍රණ සභාවෙන් ය.

**35.** එව්ටිකස්ගේ ප්‍රකාශන වේද භේදික බව පෙන්වා දුන්නේ,

(1) නසියන්ස් හි ග්‍රෙගරිතුමා ය.
(2) කොන්ස්තන්තිනෝපලයේ රදගුරු ෆ්ලේවියන්තුමා ය.
(3) නිකොමේසියාවේ රදගුරු එව්සේබියස්තුමා ය.
(4) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට්තුමා ය.
(5) මිලාන් හි රදගුරු අම්බ්‍රෝස්තුමා ය.

**36.** ශුද්ධ බයිබලයේ සඳහන් **නොවන** සෑම ඇදහිල්ලක්ම ප්‍රතික්ෂේප කළේ,

(1) මාටින් ලූතර්තුමා ය.
(2) පෙලාජියස්තුමා ය.
(3) ජෝන් වෙස්ලිතුමා ය.
(4) ජෝන් කැල්වින්තුමා ය.
(5) චාල්ස් වෙස්ලිතුමා ය.

**37.** හත්වන ක්ලෙමන්ට් ශුද්ධෝත්තම පියතුමා විසින් ප්‍රතික්ෂේප කරන ලද එංගලන්තයේ අටවන හෙන්රි රජතුමාගේ ඉල්ලීම කුමක් ද?

(1) රෝමයට පැමිණීම
(2) ප්‍රසාදස්නාපනය
(3) ඔහුට ඔටුනු පැළඳවීම
(4) දික්කසාද වීම
(5) ශුද්ධෝත්තම පියතුමා එංගලන්තයට පැමිණීම



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



**38.** ආර්ථික අවපාතයට ගොදුරු වූ පතල් කම්කරුවන් හා ගැමි ජනතාව ආධ්‍යාත්මිකව පෝෂණය කිරීමට මහත් වෙහෙසක් දරණ ලද පුද්ගලයා/ පුද්ගලයන් ඇතුළත් නිවැරදි වරණය තෝරන්න.

A - ලොයෙලාහි ඉග්නේෂස්තුමා
B - මාටින් ලූතර්තුමා
C - ජෝන් වෙස්ලිතුමා
D - චාල්ස් වෙස්ලිතුමා
E - විලියම් බූත්තුමා

(1) A (2) B (3) A හා B (4) B හා E (5) C හා D

**39.** ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව විසින් ඉදිරිපත් කරන ලද නවෝදයේ ව්‍යාපෘතියක් වන්නේ,
(1) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට උනන්දු කිරීමයි.
(2) භාරහාර වීමට උනන්දු කිරීමයි.
(3) පාද නමස්කාරය කිරීමට උනන්දු කිරීමයි.
(4) වන්දනා ගමන් යාමට උනන්දු කිරීමයි.
(5) දාන ධර්ම දීමට උනන්දු කිරීමයි.

**40.** XIII වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා විසින් සමාජ සාධාරණත්වය පිළිබඳව ලියන ලද විශ්ව ලේඛනය කුමක් ද?
(1) මාටර් එට් මජිස්ට්‍රා - මව හා ගුරුවරිය
(2) පාචෙම් ඉන් ටෙර්රිස් - ලෝක සාමය
(3) ඩේඋස් කරිටාස් එස්ට් - දෙවියන් වහන්සේ ප්‍රේමයයි
(4) රේරුම් නොවාරුම් - වෙහෙසෙන මිනිස්සු
(5) කරිටාස් ඉන් වෙරිටාටෙ - සත්‍ය තුළ දයාව

**41.** "කිසියම් කෙනෙකු තම මුළු ජීවිත කාලය තුළ නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේ දී ඉටු කර ගත නොහැකි ය." මෙය ප්‍රකාශ කළේ කවුරුන් විසින් ද?
(1) ගරු ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා
(2) ගරු ක්ලෙමන්ට් ද සූසා පියතුමා
(3) ගරු ජුසේ වාස් පියතුමා
(4) ගරු මයිකල් රුද්‍රිගු පියතුමා
(5) ගරු ප්‍රැන්සිස් සේවියර් පියතුමා

**42.** පෘතුගීසින් පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ කිතුනුවන් සිටි බවට සාක්ෂියක් වන්නේ,
(1) නුවරින් හමු වූ පූජා ඇඳුම් ය.
(2) අනුරාධපුරයෙන් හමු වූ ගල් කුරුසිය ය.
(3) පුත්තලමෙන් හමු වූ සොහොන් බිම ය.
(4) අම්පිටියෙන් හමු වූ සිරි සලුව ය.
(5) මාතරින් හමු වූ දේවමාතා ප්‍රතිමාව ය.

**43.** 'ස්කොලාකල් කොමිසම' නැමති විශේෂ ආයතනය මඟින් පාසල්වලට ගුරුවරුන් පත් කිරීම, පාලනය කිරීම, පාසල් නිරීක්ෂණය සිදු වූයේ,
(1) පෘතුගීසි පාලන සමයේ දී ය. (2) ලන්දේසි පාලන සමයේ දී ය.
(3) ඉංග්‍රීසි පාලන සමයේ දී ය. (4) නිදහස් පාලන සමයේ දී ය.
(5) සිංහල රජවරුන්ගේ පාලන සමයේ දී ය.

**44.** 'ආනන්ද කලිප්පුව' නැමති පද්‍ය කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) ගරු පිලිප්පුස් බල්දේවුස් දේවගැතිතුමා
(2) ගරු ජුසේවාස් පියතුමා
(3) ගරු ජෝශප් මේරි බ්‍රාව් පියතුමා
(4) ගරු ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා
(5) ගරු මරියා ද මිරන්ඩා පියතුමා

**45.** ශුද්ධ වූ ජුසේ වාස් පියතුමාගේ ධර්මදූත ප්‍රතිපත්තියක් වන්නේ,
(1) විදේශීය ආධාර ලබා ගැනීමයි.
(2) රෝමයෙන් මිෂනාරිවරුන් ගෙන්වා ගැනීමයි.
(3) ලතින් භාෂාව පමණක් ප්‍රචලිත කිරීමයි.
(4) වන්දනා ගමන් සංවිධානය කිරීමයි.
(5) ධර්මදූත කාර්යය සඳහා ගිහි නායකයන් පත් කිරීමයි.

**46.** ශුද්ධ වූ සභාවේ අනිවාර්ය/ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
(1) භක්තියයි.
(2) දේශානුකරණයයි.
(3) වන්දනාවයි.
(4) ශුද්ධත්වයයි.
(5) කීර්තියයි.

**47.** ක්‍රි.ව. 4 වන සියවසේ කිතුනුවන්ට නිදහස් යුගයක් උදාවූයේ කුමක් මගින් ද?
(1) එපීස මන්ත්‍රණ සභාව
(2) නිසියානු මන්ත්‍රණ සභාව
(3) රෝම ආඥාව
(4) ලීමා ආඥාව
(5) මිලාන් ආඥාව

**48.** ක්‍රි.ව. 1956 දී නිකුත් වූ බෞද්ධ කොමිසමේ වාර්තාව අනුව ශ්‍රී ලාංකීය රජය විසින් සේවයෙන් ඉවත් වන ලෙස අණ කරන ලද්දේ,
(1) රජයේ පාසල් සේවයේ නියුතු පූජකතුමන්ලාට ය.
(2) රජයේ රෝහල් සේවයේ නියුතු පැවිදි සොයුරියන්ට ය.
(3) පාසල්වල සිටි කතෝලික ගුරුභවතුන්ට ය.
(4) සමාජ සුභසාධනයේ යෙදෙන්නන්ට ය.
(5) ගුරු විද්‍යාලවල සිටි කතෝලික පූජකතුමන්ලාට ය.

**49.** සභා ජීවිතය හා විශ්වාසය සම්බන්ධව එකඟවීම් මෙන්ම වෙනස්කම් ද සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද ලියවිල්ල හඳුන්වනු ලබන්නේ,
(1) මානව සංවර්ධන ලේඛනය යනුවෙනි.
(2) විමර්ශන වාර්තාව යනුවෙනි.
(3) මැග්නා කාර්තා ලේඛනය යනුවෙනි.
(4) ලීමා ලේඛනය යනුවෙනි.
(5) අන්තර් නිකායික මිත්‍රශීලී ලේඛනය යනුවෙනි.

**50.** මනුෂ්‍යයා ස්වභාවයෙන්ම සමාජීය වන හෙයින් අනුන් සමඟ එකතු වී එකිනෙකාගේ සුභසිද්ධිය සඳහා වැඩ කිරීම අත්‍යවශ්‍ය බව පෙන්වා දෙමින් අති උතුම් 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා නිකුත් කළ විශ්ව ලේඛනය කුමක් ද?
(1) වෙහෙසෙන මිනිස්සු
(2) විශ්වාසයේ අභිරහස
(3) ලෝක සාමය
(4) වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව
(5) අතීන්ද්‍රිය ක්‍රිස්තු දේහය

* * *

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ක්‍රිස්තියානි ධර්මය II
கிறிஸ்தவம் II
Christianity II

43 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) පැරණි දිවැසිවරු කළ කී දෑ සඳහන් වන ශුද්ධ වූ බයිබලයේ ග්‍රන්ථ **දෙක** නම් කරන්න. (ලකුණු 02යි)

   (ii) දිවැසිවර ඉගැන්වීමෙහි ප්‍රධාන තේමා **දෙකක්** ලියන්න. (ලකුණු 04යි)

   (iii) යෙසායා දිවැසිවරයාට අනුව මෙසියස් වහන්සේගේ සුලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06යි)

   (iv) ආමෝස් දිවැසිවරයාගේ ජීවිතාදර්ශය අද සමාජය තුළ ඔබ ක්‍රියාවට නංවන ආකාරය කරුණු **හතරකින්** පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

2. (i) ශුද්ධ වූ පාවුලුතුමාගේ තෙවන ධර්මදූත චාරිකාවේ අරමුණු **දෙක** ලියන්න. (ලකුණු 02යි)

   (ii) ශුද්ධ වූ පාවුලුතුමා එපීසවරුන්ට ලියූ හසුනේ අරමුණු **දෙක** ලියා දක්වන්න. (ලකුණු 04යි)

   (iii) ශුද්ධ වූ පාවුලුතුමා තෙසලෝනිකවරුන්ට ලියන ලද ප්‍රථම හසුනේ ඇතුළත් වන විශේෂ කරුණු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 06යි)

   (iv) ශුද්ධ වූ පාවුලුතුමා සිය සන්දේශ මගින් කිතුනුවන් මෙන්ම කිතුනු සභාව වර්ධනයට දැරූ උත්සහය මෙන්, ඔබ කිතුනු සභාවේ දියුණුව සඳහා ක්‍රියා කරන ආකාරය කරුණු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

3. (i) පස්වන සියවසේ දී බටහිර අධිරාජ්‍යයේ විවිධ ප්‍රදේශවල බලය අල්ලාගත් ගෝත්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි)

   (ii) ක්ලුනි තාපස නිකායේ ප්‍රතිසංස්කරණවලින් අනතුරුව බිහි වූ තාපස ක්‍රම **දෙක** හා ඒවා ආරම්භ කළ පුද්ගලයන් නම් කරන්න. (ලකුණු 04යි)

   (iii) 23 වන ශුද්ධ වූ ජුවාම් ශුද්ධෝත්තම පියතුමා සිදු කළ සේවාවන් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

   (iv) පළමුවන වතිකාන මන්ත්‍රණ සභාවේ ප්‍රධාන අරමුණු **හතරක්** ලියා, ඒ අනුව ඔබ අද සමාජය තුළ ක්‍රියා කරන ආකාරය කරුණු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

[දෙවැනි පිටුව බලන්න.

## II කොටස

**4.** (i) දේවානුභාවය යනු කුමක් දැයි අර්ථ කථනය කර දේවානුභාවයේ ප්‍රභේද **තුන** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) දේවානුභාවයෙන් ලේඛන ගත කරන ලද ශුද්ධ වූ ලියවිල්ල එදිනෙදා ජීවිතයේ දී ඔබ ප්‍රයෝජනයට ගන්නා අවස්ථා **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**5.** (i) ඉශ්රායෙල් ජනතාව පොරොන්දු දේශය කරා යන ගමනේ දී ලැබූ දස පනතෙහි ලක්ෂණ **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) සාරධර්මවලින් පෝෂිත ජීවිතයක් ගත කිරීම සඳහා පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබට දස පනත යොදාගත හැකි ආකාරය පනත් **පහක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**6.** (i) 1 කොරින්ති 13 පරිච්ඡේදයේ ශුද්ධ වූ පාවුලුතුමා සඳහන් කරන ප්‍රේමයේ ලක්ෂණ **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) 'කිතුනු පවුල ශුද්ධ වූ සභාවේ ජීවනාලියයි.' ප්‍රේමයෙන් බැඳුණු කිතුනු පවුලක් ලෙස ශුද්ධ වූ සභාව තුළ ක්‍රියාශීලී ව කටයුතු කළ හැකි අවස්ථා **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**7.** (i) ශුද්ධාත්ම ආගමනය හා එදින සිදු වූ විශේෂ සිදුවීම් කරුණු **පහක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ ඔබ, අපෝස්තුලුවරු මෙන් සමාජය තුළ දූත සේවාව ඉටු කරන ආකාරය කරුණු **පහක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10යි)

**8.** (i) පෘතුගීසි පාලන සමයේ දී ශ්‍රී ලාංකිකයන්ට ලැබුණු යහපත් ප්‍රතිඵල **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) විදේශීය ධර්මදූත කණ්ඩායම්වලින් මෙරටට සිදු වූ සේවාවන් **පහක්** ලියා, අද ධර්මදූත සේවයේ නියැලෙන්නන්ට එයින් ගතහැකි ආදර්ශ **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

* * *


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

LOL Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

# 25% OFF ALL BOOKS

Including Exercise Books, CR Books, and B5 Books




**ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්**

**ORDER BOOKS FROM LOL BOOKS STORE**

0372060110 WWW.LOL.LK

071 777 4440 (WhatsApp)

**Cash On Delivery Available**


ORDER GCE A/L SHORT NOTES, MODEL, REVISION BOOKS & PAST PAPERS IN SINHALA, ENGLISH & TAMIL MEDIUM
LOL BOOK STORE
CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE
WHATSAPP - 0717774440
WEBSITE: WWW.LOL.LK
GET READY FOR YOUR A/Ls WITH LOL BOOK STORE!